# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1711/25 - 2011 ජුනි 24 වැනි සිකුරාදා - 2011.06.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී-බී 6/2001(III).

**2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත**

2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 13 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ (ආ) ඡේදය සහ 81 වැනි වගන්තියේ (උ) ඡේදය සමග කියවිය යුතු එකී පනතේ 105 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් සාදනු ලබන රීති.

සභාපති,
ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය.

2011 ජුනි මස 23 වැනි දින,
කොළඹ දී ය.

රීති

2005 සැප්තැම්බර් මස 29 වැනි දින අංක 1412/30 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2005 රක්ෂණ මණ්ඩල රීති පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) එහි 4 වැනි රීතියට ඉක්බිතිව ම පහත දැක්වෙන රීතිය ඇතුළත් කිරීමෙන් :-

"4අ. මේ පනත යටතේ ශ්‍රී ලංකාව තුළ රක්ෂණ ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා රක්ෂණකරුවකු ලෙස ලියාපදිංචි වීමට අදහස් කරන යම් තැනැත්තෙකු සතුව එක් එක් රක්ෂණ ව්‍යාපාර පන්තිය වෙනුවෙන් රුපියල් මිලියන පන් සියයකට නොඅඩු ගෙවා නිමි කොටස් ප්‍රාග්ධනයක් තිබිය යුතු ය. ";

(2) එහි 6 වැනි රීතියේ "රුපියල් පනස් දහසක" යන වචන වෙනුවට "රුපියල් ලක්ෂ එකක" යන වචන ආදේශ කිරීමෙන් ;

(3) එහි 11 වැනි රීතියේ "මණ්ඩලය" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ නිරූපණ ඇතුළත් කිරීමෙන් :-

""රක්ෂණ ව්‍යාපාර පන්තිය" යන්නට පනත යටතේ ඒ යෙදුමට ලබා දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"රක්ෂණ ව්‍යාපාරය" යන්නට පනත යටතේ ඒ යෙදුමට ලබා දී ඇති අර්ථය ම තිබිය යුතු ය.".

07-225


1A - PG 1260 —340 (2011/06)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.